සියළු හිමිකම් ඇවිරිණි/All Rights reserved

කළුතර අධ්‍යාපන කලාපය
Kalutara Zonal Education

08	S	I

කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර
අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය -2025
Third Term Test – Grade 13 - 2025

විභාග අංකය :

කෘෂි විද්‍යාව I

කාලය පැය 02

උපදෙස්
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1-50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4) හා (5) යන පිළිතුරු වලින් නිවරදි පිළිතුර හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. කෘෂිකර්මාන්තය ආශ්‍රිත කර්මාන්තයක් හා සේවාවක් වනුයේ පිළිවෙලින්
1. තේ පැළ නිපදවීම හා ගොවිපළ ගොඩනැගිලි ද්‍රව්‍ය සැදීමය.
2. ගොවීන්ට ජල සම්පාදන තාක්ෂනය ලබාදීමා හා කෘෂි අස්වනු ප්‍රවාහනය.
3. තේ වගාව සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම හා කෘෂි යන්ත්‍ර සූත්‍ර නඩත්තුවය.
4. කෘෂි භාණ්ඩ අලෙවිය හා ගව නිවාස ඉදිකිරීමය.
5. සහල් පිටි නිෂ්පාදනය හා කෘෂි කාර්මික රක්ෂණය ලබාදීමය.

02. බහුජන සංවිධානයකට අයත් නොවන ආයතනය වනුයේ,
1. ලෝක සෞඛ්‍යය සංවිධානය (WHO)
2. සර්වෝදය
3.UNDP
4. CARE ජාත්‍යන්තර සංවිධානය
5. අර්ථවර්යා පදනම

03. අනිලමානයේ ප්‍රධාන භාවිතය වනුයේ,
1. වායුගෝලීය පීඩනය මැනීමය.
2. ආලෝකයේ ගුණාත්මය මැනීමය.
3.ප්‍රවේගය මැනීමය.
4. දිශාව මැනීමය.
5. කැළඹිලි මැනීමය.

04. අචල පෝෂක ඌනතා ලක්ෂණ මුලින්ම නිරීක්ෂණය කළ නොහැකි වනුයේ,
1. මේරූ පත්‍ර වලය.
2. වර්ධනය වෙමින් පවතින මල් වලය.
3. වර්ධනය වෙමින් පවතින බීජ වලය.
4. වර්ධනය වෙමින් පවතින ඕනෑම කොටසකය.
5. නොමේරූ පත්‍ර වලය.

05. පසේ වෙසෙන නයිට්‍රීහරණ බැක්ටීරියාවක් වනුයේ,
1. නයිට්‍රොබැක්ටර් Nitrobactor.
2. නයිට්‍රොසෝමොනාස් Nitrosomonas.
3.ප්ස්‍යුඩොමොනාස් Pseudomonas
4. නයිට්‍රොකොකස් Nitrococcus.
5. රයිසෝබියම් Rhizobium.

06. ප්‍රශ්න අංක 06 ට පිළිතුරු සැපයීමට පහත ප්‍රකාශය යොදාගන්න.
"ගල්පර මතින් වේගයෙන් සතුන් ගමන්කිරීමේදී සත්ව කුර ගැටීමෙන් විශාල පර්වත ගෙවීයයි." මෙම ක්‍රියාදාමය හොදින්ම පැහැදිලි කළ හැක්කේ.
1. පාෂාණ වල දිය වීම ලෙසය.
2. පාංශු ජනනය ලෙසය.
3. පාෂාණ වල රසායනික ජීර්ණය ලෙසය.
4. පාෂාණ වල භෞතික ජීර්ණය ලෙසය.
5. පාෂාණ වල ජෛවීය ජීර්ණය ලෙසය.

ALapiedu.com

07. දී ඇති රූප සටහනින් දැක්වෙන සාම්ප්‍රදායික ජල එසවුම් ක්‍රමය වනුයේ,



1. පැද්දෙන යොත්ත ලෙසය.
2. කප්පිය ලෙසය.
3. ආඩියා ලිඳ ලෙසය.
4. බාල්දි දම්වැල ලෙසය.
5. දිය රෝදය ලෙසය.

08. තිරිඟු හා බාර්ලි වැනි බෝග සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය වනුයේ,

1. පිටාර ජල සම්පාදන ක්‍රමය.
2. බේසම් ජල සම්පාදන ක්‍රමය.
3. ඇලිවැටි ජල සම්පාදන ක්‍රමය.
4. තීරු ජල සම්පාදන ක්‍රමය.
5. කල වාරි ක්‍රමය යි.

09. බෝග සංස්ථාපනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. බීජ සිටුවීමේදී එකම ගැඹුරක් පවත්වා ගැනීමෙන් ඒකාකාරව පරිණත වූ බෝගයක් ලබා ගැනීමට මඟ පෑදේ.

B. සෘජුව ක්ෂේත්‍රයේ බීජ වැපිරීමේ වාසියක් වනුයේ අඩු බීජ ප්‍රමාණයක් අවශ්‍ය වීමය

C. පේළි ලෙස සිටුවීමෙන් වල් පැළ පාලනයට යන ශ්‍රම අවශ්‍යතාවය අඩුකළ හැකිය.

ඉහත ප්‍රකාශන අතුරින් නිවරදි වනුයේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A හා C පමණි.
5. B හා C පමණි.

10. උක් වගාව සිදුකරන ගොවි මහතකු තම වගාවේ පරාග ප්‍රරෝහණය වැඩි කර ගැනීමට යෙදිය යුතු වර්ධක යාමකය වනුයේ.

1. ඔක්සින ය.
2. ගිබරලින ය.
3. සයිටොකයිනින් ය.
4. ඇබ්සසික් අම්ලයය.
5. එතිලීන් ය.

11. පහත රූපසටහනට අනුව තාපකාමී ක්ෂුද්‍ර ජීවීන් ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරී වන්නෙ

1. A තුළ පමණි.
2. B තුළ පමණි.
3. B හා C තුළ පමණි.
4. A හා C තුළ පමණි.
5. B හා D තුළ පමණි.



12. පසක් සංතෘප්ත අවස්ථාවේ ජල ප්‍රතිශතය 60%ක් ද, ක්ෂේත්‍ර ධාරිතාවේදී ජල ප්‍රතිශතය 30%ක් ද,ස්ථිර මැලවීමේ අවස්ථාවේදී ජල ප්‍රතිශතය 15%ක් ද වේ. එම පස ජලයෙන් සංතෘප්ත අවස්ථාවේ පවතීනම් ගොඩ බෝග වගාවට සුදුසු තත්වයට පත් කිරීමට පසෙන් ජල වහනය කල යුතු ප්‍රතිශතය වන්නේ,

1) 45% කි. (2) 90% කි. (3) 30% කි. (4) 15% කි. (5) 75% කි.

13. පහතරට එළවළු වගාවක් කිරීමට බලාපොරොත්තුවන භූමියක පසෙහි අඩංගු සංඝටක පහත වගුවේ දැක්වේ.

පාංශු ඛණිජ	කාබනික ද්‍රව්‍ය හා ජීවීන්	පාංශු ජලය	පාංශු වාතය
65%	13%	15%	17%

ඉහත පසෙහි සාර්ථකව එළවළු වගා කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීමට කළ යුත්තේ,

1. පසට හොඳින් ජලය සම්පාදනය කර රසායනික පොහොර යෙදීමයි.
2. පස හොඳින් ජල වහනය කර කාබනික පොහොර යෙදීමයි.
3. ශුන්‍ය බිම් සැකසීම සිදුකිරීමයි.
4. කාබනික ද්‍රව්‍ය යොදා පස පෙරලීමයි.
5. පස හොඳින් ජල වහනය කර අවම බිම් සැකසීම සිදුකිරීමයි.

ALapiedu.com

14. ශාක වර්ධන වක්‍රය නිවරදිව පෙන්වන ප්‍රස්ථාරය වනුයේ,

1.


2.


3.


4.


5.


15. ශාක වලට ද්‍රව්‍ය අවශෝෂණය හා ශාකය තුළ පරිවහනය වන ක්‍රම පහත දක්වා ඇත.ඒ අතුරින් නොගැලපෙන සම්බන්දය තෝරන්න.

1. පාංශු ජලය මූල කේෂ තුළට ගමන් කිරීම - ආසෘතිය මඟින් සිදුවේ.
2. බීජ පෙහවීමේ දී බීජ තුළට ජලය ගමන් කිරීම - නිපානය මඟින් සිදුවේ.
3. සෛලම පටකය වෙත ඇතුල්වන ජලය ශාක කඳ ඔස්සේ ඉහළට පරිවහණය,විසරණය මඟින් සිදුවේ.
4. සෛලම පටකය ඔස්සේ ජලය ගමන් කිරීම - ස්කන්ධ ප්‍රවාහය මඟින් සිදුවේ.
5. ශාක වලට ඛණිජ ලවණ අවශෝෂණය - සක්‍රීය අවශෝෂනය මඟින් සිදුවේ.

16. පාංශු සංරක්ෂණ ක්‍රම අතරින් ජීව විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රමය වනුයේ,

1. SALT ක්‍රමය.
2 හෙල්මළු යෙදීම.
3. සමෝච්ච ආකාරයට බිම් සැකසීම.
4. නිසියාකාර භූමි පරිභෝජනය.
5. සමෝච්ච කාණු යෙදීම.

17. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සහතික කළැ බීජ නිෂ්පාදන ක්‍රියාවලියේ නිවරදි අනුපිළිවෙල වනුයේ,

1. අභිජනන බීජ,ලියාපදිංචි බීජ,පදනම් බීජ සහ සහතික කළ බීජ ය.
2. අභිජනන බීජ, පදනම් බීජ, ලියාපදිංචි බීජ සහ සහතික කළ බීජ ය.
3. පදනම් බීජ, අභිජනන බීජ, ලියාපදිංචි බීජ හා සහතික කළ බීජ ය.
4. පදනම් බීජ,ලියාපදිංචි බීජ, අභිජනන බීජ හා සහතික කළ බිජ ය.
5. සහතික කළ බීජ, අභිජනන බීජ පදනම් බීජ සහ ලියාපදිංචි බීජ ය.

18. නිර්පාංශු වගාවේදී සිරස් ලෙස රුදවූ වගා මලු භාවිතය පිළිබඳ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ

A. සිරස් වගා මලු සඳහා පාරජම්බුල කිරණ ප්‍රතිරෝධී, ඇතුළත කළු හා පිටත සුදු පොලිතීන් භාවිත කරයි.
B. සිරස් වගා මලු පිරවීම සඳහා ජීවානුහරිත කොහු කෙඳි භාවිත කෙරේ.
C. සිරස් වගා මලුවල සිටුවා ඇති බෝග පෝෂණය කිරීමට නයිට්‍රජන්, පොටෑසියම් හා පොස්පරස් පමණක් අඩංගු දියර පොහොර වර්ගයක් යොදා ගනු ලැබේ.

ඉහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. B හා C පමණි.
5. A, B හා C යන සියල්ලම ය.

19. අසමාකාර මතුපිටක් සහිත වැලිමය පසක වැවූ වාර්ෂික බෝගයකට වඩාත් ගැළපෙන ජල සම්පාදන ක්‍රමය වනුයේ,

1. බේසම් ජල සම්පාදන ක්‍රමයයි.
2. පිටාර ජල සම්පාදන ක්‍රමයයි.
3. උප පෘෂ්ඨීය ජල සම්පාදනයි.
4. විසිරි ජල සම්පාදන ක්‍රමයයි.
5. බිංදු ජල සම්පාදන ක්‍රමයයි.

20. ශාකයකට ලබාගත හැකි ජලය ලෙස සලකනු ලබන්නේ,

1. ජලාකර්ෂණ ජලයයි.
2. කේෂාකර්ෂණ ජලයයි.
3. ගුරුත්වාකර්ෂණ ජලයයි.
4. නිදහස් ජලයයි.
5. අතිරික්ත ජලයයි.

ALapiedu.com

21. උග්‍ර විෂ කෘමිනාශක ලේබලයක පහළ දාරයේ පැහැය විය හැක්කේ,
1. රතු හෝ දුඹුරු 2. රතු හෝ කහ 3. කහ හෝ නිල්
4. කොළ හෝ සුදු 5. රතු හෝ සුදු

22. රූප සටහනේ දක්වා ඇති පළිබෝධකයාගේ ගෝත්‍රය වනුයේ,
1. ඩිප්ටෙරාය.
2. හයිමෙනොප්ටෙරාය.
3. හෝමොප්ටෙරාය.
4. කෝලියොප්ටෙරාය.
5. ලෙපිඩොප්ටෙරාය.

23. වාර්ෂික වල්පැළෑටි පාලනය සඳහා වඩාත් ඵලදායී වල්පැළ පාලන ක්‍රමය වනුයේ,
1. ජෛව විද්‍යාත්මක වල් පැළ පාලන කාරක හඳුන්වාදීමය.
2. වල් පැළවල වායව කොටස් කපා පිළිස්සීමය.
3. සියල්ල නසන වල්නාශක භාවිතය ය.
4. ක්‍රමානුකූලව බිම් සැකසීම සිදු කිරීමය.
5. බීජ නිෂ්පාදනයට ඉඩ නොහැරීම ය.

24. ගොවිමහතෙකු පළිබෝධ පාලනය කිරීමට තම ක්ෂේත්‍රයේ ආලෝක උගුලක් ස්ථාපිත කළේය.
මෙම ක්‍රමය මඟින් සාර්ථකව පාලනය කළ හැකි සත්ත්ව පළිබෝධ කාන්ඩය වනුයේ,
1. පක්ෂීන් 2. මෘද්වංශීන් 3. ක්ෂීරපායින්
4. කෘන්තකයින් 5. කෘමීන්

25. ශාක වල බහුගුණකතාවය පිළිබඳව සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. චතුර් ගුණ ශාක,ද්වී ගුණ ශාක වලට වඩා විශාල ඵල නිපදවයි.
2. ත්‍රී ගුණ ශාක ,ද්වීගුණ ශාක වලට වඩා විශාල ඵල නිපදවයි.
3. පටක රෝපණය භාවිතයෙන් බහුගුනක ශාක නිපදවිය නොහැකි ය.
4. ශාක වල බහු ගුණකතාව කලාතුරකින් ස්වාභාවිකව ඇතිවේ.
5. ත්‍රී ගුණ ශාක,සරු බීජ සහිත ඵල නිපදවයි.

26. ඉහත ඇටවුම මඟින් නිරූපණය වන නිර්පාංශු වගා ක්‍රමය වනුයේ,
1. සිරස් වගා මලු තාක්ෂණය ය.
2. තිරස් වගා මලු තාක්ෂණය ය.
3. පාවෙන මුල් ගිල්වූ වගාව ය.
4. ගැඹුරු පෝෂක ධාර තාක්ෂණය ය.
5. නොගැඹුරු පෝෂක ධාරා තාක්ෂණය ය.



27. සිරුර තුළ විටමින් D මඟින් ඉටුවන කාර්යයක් වන්නේ,
1. ශරීරය තුළ කොලෙස්ටරෝල් නිෂ්පාදනය යි.
2. රුධිරගත සීනි මට්ටම පාලනය යි.
3. ශරීරයේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම යි.
4. කැල්සියම් හා පොස්පරස් අවශෝෂණය කිරීමට උපකාරී වීම යි.
5. මේද ද්‍රාව්‍ය විටමින් අවශෝෂණයට උපකාරී වීම යි.

28. බෝග අස්වනු වල පරිණත බව නිර්ණය කරන සාධක කිහිපයක් පහත දැක්වේ.
A - විශිෂ්ඨ ගුරුත්වය B – PH අගය C - බර D - මෘදු හෝ දෘඩ බව

බෝග අස්වනු වල පරිණත බව නිර්ණය කරන භෞතික සාධක වනුයේ,

1. C පමණි. 2. B පමණි. 3. C හා D පමණි.
4. A,C හා D පමණි. 5. A, B ,C හා Dයන සියල්ලම ය.

29. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේදී උඩරට ප්‍රදේශ වලදී යොදා ගත හැකි පහත සඳහන් ව්‍යුහ අතරින් අපනයනය සඳහා මල් වගා කිරීමට වඩාත් බහුලව යොදාගන්නා ව්‍යුහය වන්නේ

1. පොලිතින් උමං 2. දැල් ගෘහ 3. ලී පටි නිවාස
4. ශීත රාමු 5. හරිතාගාර

ALapiedu.com

30. සුබ්‍රිකරණයේදී සෝඩියම් මෙටාබයිසල්ෆයිට් භාවිත කරනුයේ,

1. ආහාර ජීවානුහරණය කිරීමට ය.
2. එන්සයිම අක්‍රිය කිරීමටය.
3. වර්ණය තිර කිරීමටය.
4. ස්වාදය වැඩිදියුණු කිරීමටය.
5. වයනය වඩි දියුණු කිරීමටය.

31. ආන්ත උපරිම වන පළතුරු ඉදීමේ ක්‍රියාවලිය නිවරදිව දැක්වෙන ප්‍රස්ථාරය වනුයේ,

1. 

2. 

3. 

4. 

5.

32. ජාන සම්පත් සංරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - ස්වභාවික රක්ෂිත B – බීජ බැංකු C - උඩරට ගෙවතු D -ඔසු උයන්

පරිබාහිර ජාන සංරක්ෂණය අඩංගු වනුයේ,

1. A හා B පමණි.
2. C හා D පමණි.
3. A හා C පමණි.
4. A,B හා C පමණි.
5. B ,C හා D පමණි.

33. කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය සම්පත් හිඟකම නිසා හටගන්නා අභියෝගවලට තාක්ෂණය භාවිතයෙන් ගත හැකි විසඳුමක් වන්නේ,

1. ජෛව ගතික ගොවිතැන ය.
2. සමෝධානික ගොවිතැන ය.
3. ශෂ්‍ය බෝග වගාව ය.
4. යථා තත්‍ය කෘෂිකර්මාන්තය ය.
5. කාබනික ගොවිතැන ය.

34. දී ඇති රූප සටහනේ දැක්වෙන උපකරණය ප්‍රධාන වශයෙන් භාවිත කරනුයේ පලතුරු වල,

1. තද බව මැනීමට යි.
2. අන්තර් ගත සීනි ප්‍රමාණය මැනීමටයි.
3. වර්ණය මැනීමටයි.
4. විශිෂ්ඨ ගුරුත්වය මැනීමටයි.
5. PH අගය මැනීමටයි.

35. බෲසෙල්ලෝසිස් රෝගයේ රෝග ලක්ෂණයක් නොවන්නේ,

1. උදරයේ වේදනාව.
2. ශරීරයේ බර සීඝ්‍ර ලෙස වැඩිවීම.
3. නිදිමත හා අලස බව.
4. සන්ධි වේදනාව.
5. උණ නැගීම හා බැසීම.

36. දේශීය කිරි ගවයන්ගේ කිරි නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කර ගැනීමට යොදා ගත හැකි වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

A - උසස්වර්ගයේ විදේශීය සතුන් සමඟ දෙමුහුම් කිරීම. B – සතුන්ට උසස් පෝෂණයක් ලබාදීම.
C - සතුන් වරණය කිරීම D - සත්ත්ව සෞඛ්‍යය වැඩි දියුණු කිරීම

මේවා අතුරින් වඩාත් යෝග්‍ය දිගු කාලීන සහ කෙටිකාලීන ක්‍රියාමාර්ගයක් ලෙස සැලකිය හැක්කේ පිළිවෙළින්,

1. A හා B 2. B හා C. 3. C හා D 4.A හා C 5. B හා D

ALapiedu.com

37. ගවයාගේ ආහාර මාර්ග පද්ධතියේ සංකීර්ණ ආමාශයේ කොටස් අන්නසෝත්‍රය සිට ග්‍රහණිය දක්වා සම්බන්ධවන ආකාරය පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ කුමක්ද?

1. විතංශිකාව,බහුනැමිය,රූමනය සහ ජඨරාශය වේ.
2. ජඨරාශය, විතංශිකාව, රූමනය සහබහුනැමිය වේ.
3. රූමනය,බහුනැමිය, විතංශිකාව සහ ජඨරාශය වේ.
4. ජඨරාශය,බහුනැමිය,රූමනය සහ විතංශිකාව වේ.
5. රූමනය, විතංශිකාව,බහුනැමිය සහ ජඨරාශය වේ.

38. සයිලේජ නිපදවන සයිලෝවක් තුළ අඩු ආම්ලික තත්වය,ද්‍රාව්‍ය කාබෝහයිඩ්‍රේට ඌනවීම හා ස්වායු තත්ත්වය යන තත්වයන් දැකගත හැකි විය.මෙහිදී ඇතිවන එලයක් වනුයේ,

1. ඇසිටික් අම්ලය
2. බියුට්‍රික් අම්ලය .
3. ප්‍රොපියොනික් අම්ලය
4. ෆෝමික් අම්ලය
5. ලැක්ටික් අම්ලය

39. ගොවියකු සතු 600kg බර එළදෙනෙකුට දෛනිකව තෘණ ලබාදීම සඳහා ගොවියා දිනකට කොපමණ පෝෂ තෘණ ප්‍රමාණයක් සාමාන්‍යයෙන් සැපයිය යුතුද?

1. 20kg 2. 30kg. 3. 40kg 4.50kg 5. 60kg

40. කුකුල් පාලනයේදී භාවිත කරන ආහාර සලාක සම්බන්ධයෙන් නිවරදි ප්‍රකාශය තෝරන්න.

1. ඕනෑම ආහාර සලාකයක ආරම්භක සලාකයේ මේද ප්‍රතිශතයට වඩා දෙගුණයක් පමණ වැඩිපුර මේද අම්ල ප්‍රතිශතයක් අවසන් සලාකයේ ඇත.
2. බ්‍රොයිලර් සතුන්ගේ ආහාර සලාකවල ආරම්භක සලාකයේ ප්‍රෝටීන් ප්‍රතිශතය අවසන් සලාකයේ ප්‍රෝටීන් ප්‍රතිශතයට වඩා වැඩිය.
3. බිත්තර දමන මුල් අවධියේ දෛනිකව එක් සතෙකුට 125g න් ආහාර සැපයීම ආරම්භ කර අවසානයේදී 255gක ප්‍රමාණයක් දක්වා වැඩි කළ යුතුය. .
4. බිත්තර දමන කිකිළියන්ගේ අවසන් සලාකයේ දළ පරිවෘත්තීය ශක්තිය ආරම්භක සලාකයට වඩා අඩුය..
5. බ්‍රොයිලර් සතුන්ගේ සති 2 දක්වා ආරම්භක සලාකයද සති 2 සිට අවසානය දක්වා අවසාන සලාකයද සැපයිය යුතුය.

41. කුකුළු රැළක සතුන් බොහොමයක් පහත රෝග ලක්ෂණ පෙන්නුම් කළේය.

- සුදු හා කොළ පැහැයට මළ පහ වීම.
- නාසයෙන් හා මුඛයෙන් දියර ගැලීම
- ශ්වසනය කිරීමෙ අපහසුව
- පසුපසට හෝ රවුමට ඇවිදීම

මෙම රෝග ලක්ෂණ වලට අනුව වැළඳී ඇති රෝගය වනුයේ,

1. කොක්සිඩියෝසිස්
2. රැනිකට්
3. පුල්ලෝරම්
4. කුකුළු වසූරිය
5. ගම්බෝරො

42. බිත්තර දමන කිකිළියකුගේ ඇති ලක්ෂණයක් වනුයේ,

1. ස්ථූල ශරීරයක් තිබීම.
2. ආහාර පරිවර්තන කාර්යක්ෂමතාවය අඩු වීම. .
3. වර්ෂයකට බිත්තර 120-150 ක් පමණ දැමීම ය.
4. ගෙවී ගිය පිහාටු හා නියපොතු තිබීමය.
5. බිත්තර රැකීමට පෙළඹීමය.

43. බිත්තර වල බාහිර සහ අභ්‍යන්තර ලක්ෂණ අනුව බිත්තර රැක්කවීම සඳහා තෝරාගනු ලැබේ.රැක්කවීමට සුදුසු බිත්තර වල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - බර B - හැඩය C - කටුවේ ස්වභාවය
D - පවතින කහ මද ගණන E - ලේ පැල්ලම් වලින් තොර වීම

මින් බාහිර ලක්ෂණ ලෙස සලකනු ලබන්නේ,

1. A ,B හා C .
2. B ,C හා D.
3. C,D හා E.
4. A, D හා E..
5. සියලුම ලක්ෂණ.

44. වෙලඳපොළක අතිරික්තයක් දක්වා භාණ්ඩ සැපයුම වැඩිවිය හැකි අවස්ථාවක් නොවන්නේ කුමක්ද?

1. සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක කිරීමටය.
2. පාලන මිල ක්‍රමය ක්‍රියාත්මක කිරීමය. .
3. ප්‍රවාහන සහ වෙළඳපොළ .පහසුකම් දියුණුවීමය.
4. නිෂ්පාදන තාක්ෂණය දියුණු වීමය.
5. දේශගුණික සාධක හිතකර වීමය.

ALapiedu.com

45. ජනතාව උපරිම නිෂ්පාදනයකට නොව,ප්‍රශස්ථ නිෂ්පාදනයක් කරා ළඟා වීමට අවශ්‍ය වන්නේ එමඟින්,
1. උපරිම නිෂ්පාදනයට ලගාවීමේ ආරම්භක අඩිතාලම වන නිසාය.
2. වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර රට තුළ නිපදවා ගැනීම සඳහා ඇති එකම මාර්ගය වන නිසාය.
3. ගොවිපොළ කළමණාකරණය පහසු වන නිසාය.
4. කෘෂිකර්මය ආශ්‍රිත ගැටලු බොහොමයක් මෙමඟින් නිරාකරණය වන නිසාය.
5. නිෂ්පාදන ප්‍රශස්ථ මට්ටමක ඒකාකාරීව පවත්වා ගැනීමෙන් කෘෂිකර්මාන්තයේ තිරසර බව රැකගත හැකි නිසාය..

46. යම් නිෂ්පාදනයක් සඳහා දරීමට සිදුවන පිරිවැය පහත දී ඇත.

නිමවුම් ඒකක ගණන(kg)	1	2	3	4	5
විචල්‍ය පිරිවැය (රු)	10	20	25	28	30

ඉහත නිෂ්පාදනය සඳහා ස්ථාවර පිරිවැය රුපියල් විස්සක් නිෂ්පාදනය කිලෝග්‍රෑම් හතරක් නිපදවන අවස්ථාවේ සාමාන්‍ය පිරිවැය වන්නේ,
1. රු. 7 කි . 2. රු. 12 කි. 3. රු. 20 කි. 4.රු. 28 කි. 5. රු. 5 කි.

47. කෘෂි කාර්මික උපකරණ ආශ්‍රිත අධික ශබ්දයේ අහිතකර බලපෑම් නොවන වරණය කුමක්ද?
1. අධ්‍යාතතිය (Hypertension) ඇති වීම.
2. අභිස්පන්දය (Palpitation) ඇති වීම. .
3. නින්දට හා විවේකයට බාධා ඇතිවීම.
4. වලිප්පුව හට ගැනීම.
5. අති අම්ලය (Hyper acidity) ඇති වීම.

48. පරාගණයට දායක වන ජීවී පරාග කාරක කෘමියකු නොවන පරාගකාරකයකු සිටින වරනය කුමක්ද?
1. මී මැස්සන්,ඩම්බල් මී මැස්සන්,බඹරුන්
2. ඩම්බල් මී මැස්සන්,බඹරුන්,සමනළයන්
3. බඹරුන්,සමනළයන්,දෙමලිච්චන්
4. බඹරුන්,සමනළයන්,පැණි කුරුල්ලන්
5. මී මැස්සන්,ඩම්බල් මී මැස්සන්,මැසිමාරා

49. දේශගුණ විපර්යාස මඟින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ඇතු වන හිතකර බලපෑමක් ලෙස සලකිය හැක්කේ,
1. අඩු උෂ්ණත්වය නිසා බෝග අස්වැන්න ප්‍රමාණාත්මකව හා ගුණානාත්මකව අඩු වීමයි.
2. වැඩි උෂ්ණත්වය නිසා C4 බෝග ශාක වල අස්වැන්න වැඩි වීම.
3. වැඩි උෂ්ණත්වය නිසා C4 වල් පැලෑටිවල හානිය අඩුවීම.
4. අකලට වැටෙන වැසි මඟින් ජලාශ පිරී යාම නිසා වගා බිම් සරු වීම.
5. නියං තත්ත්ව මඟින් කාර්යක්ෂම ගොවිපොළ ජල කළමණාකරණය.

50. සුළු පරිමාණ කෘෂි ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් පාර්ශ්වකරුවන් වන්නේ,
1. ප්‍රජා පරිසරය
2. ගෝලීය පරිසරය
3. දේශපාලන හා නෛතික පරිසරය
4. තාක්ෂණික පරිසරය
5. සැපයුම් කරුවන්

ALapiedu.com

සියළු හිමිකම් ඇවිරිණි/All Rights reserved

කළුතර අධ්‍යාපන කලාපය
Kalutara Zonal Education

08	S	I

කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන
කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර
අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන කලාපය කළුතර අධ්‍යාපන

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය -2025
Third Term Test – Grade 13 - 2025

විභාග අංකය :

කෘෂි විද්‍යාව II

කාලය පැය 3

උපදෙස්

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා දක්වන්න.**

1. A.



(i) රූපයේ දැක්වෙන උපකරණය කුමක් ද? ....

(ii) මෙහි A,B සහ C කොටස් නම් කරන්න.

A - ....

B - ....

C - ....

(iii) මෙහි සඳහන් කොටස්වලට අමතරව පාඨාංක ලබා ගැනීම සඳහා භාවිත කරන උපාංගය සඳහන් කරන්න.

....

B.

(i) ප්‍රධාන දේශගුණික කලාප සම්බන්ධ පහත වගුව සම්පූර්ණ කරන්න

ප්‍රධාන දේශගුණික කලාපය	වාර්ෂික වර්ෂාපතනය	ප්‍රධාන පස් කාණ්ඩය	කෘෂි පාරිසරික කලාප ගණන
තෙත් කලාපය			
වියළි කලාපය			

(ii) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

ALapiedu.com

C. පසක භෞතික, රසායනික සහ ජෛව ගුණාංග බෝග වර්ධනය කෙරෙහි සෘජු බලපෑමක් දක්වයි.

(i) සිලින්ඩරාකාර උපකරණයක් භාවිතයෙන් පසෙහි පිහිටි ආකාරයටම පස් සාම්පලයක් ලබා ගන්නා ලදී.පහත දත්ත වාර්තා කරන ලදී

- පස් සාම්පලය + සිලින්ඩරයෙහි බර =373g
- උඳුනේ වියලූ පස් සාම්පලය + සිලින්ඩරයෙහි බර = 310g
- සිලින්ඩරයෙහි බර = 100g
- සිලින්ඩරයෙහි පරිමාව = $150cm^3$

a) පස් නියැදියේ දෘෂ්‍ය ඝනත්වය සොයන්න

....

....

....

....

....

b) පාංශු නියැදියේ බර අනුව තෙතමන ප්‍රතිශතය සොයන්න

....

....

....

....

c) බෝග වගාවට දෘෂ්‍ය ඝනත්වයේ ඇති වැදගත්කම් දෙකක් සඳහන් කරන්න

1...

2...

(ii) මන්සල් වර්ණ සටහන මගින් පසක වර්ණය තීරණය කිරීමට යොදා ගන්නා නිර්ණායක තුනක් නම් කරන්න.

1. ....
2. ....
3. ....

(iii) බෝග වර්ධනයට බලපාන ප්‍රධාන පාංශු රසායනික ගුණාංග තුනක් ලැයිස්තුගත කරන්න

1. ....
2. ....
3. ....

D. ගොවියකු සිය මෑ වගාවේ පැළවල පත්‍රයන්හි අසාමාන්‍ය වර්ණ ගැන්වීමක් දැක කෘෂිකර්ම උපදේශක වෙත දන්වනු ලැබී ය. එය පොස්පරස් ඌනතාව බව ඔහු විසින් හඳුනා ගන්නා ලදී.

(i) ගොවියා සිය මෑ පැළවල දැකිය යුතු රෝග ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

(ii) ශාක වර්ධනයේ දී පොස්පරස්වල ක්‍රියාවන් දෙකක් නම් කරන්න

1. ....
2. ....

ALapiedu.com

(iii) මෙම වගාවට යෙදීමට උචිත රසායනික පොහොර වර්ගයක් නම් කරන්න

....

(iv) පොහොර භාවිත කාර්යක්ෂමතාව දියුණු කිරීමට යොදාගත හැකි උපාය මාර්ග තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

E. ඉහළ අස්වැන්නක් ලබා ගැනිමට මනා බෝග සංස්ථාපනයක් අවශ්‍ය වේ.

(i) බීජ වැපිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

(ii) බීජ වැපිරිමට සාපේක්ෂව පැළ සිටුවිමේ වාසි තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

2. A.

(i) දුර්වල ජලවහනය නිසා පසට වන අහිතකර බලපෑම් තුනක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....

(ii) වගා ක්ෂේත්‍රයක දුර්වල ජලවහන තත්ත්වයක් ඇති වීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

(iii) උප පෘෂ්ඨීය ජලවහන ක්‍රම දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

(iv) ජලවහනය දියුණු කිරීම සඳහා කාණු පද්ධති සැකසිය හැකි ආකාර දෙකක් සඳහන් කර ඒවායේ නම් කළ රූප සටහන් ඇඳ දක්වන්න

....
....
....
....
....
....

ALapiedu.com

B. පහත කෘෂිකාර්මික භාවිතයන් සඳහා යොදා ගන්නා හෝමෝන වර්ග සඳහන් කරන්න

කෘෂිකාර්මික භාවිතය	හෝමෝනය
1. විසිතුරු මල් සහිත ශාකවල පාර්ශ්වික අංකුර වර්ධනය උත්තේජනය කරගැනීම	
2. අතු කැබලිවලින් මුල් අද්දවා ගැනීම	
3. අන්නාසි ශාකවල පුෂ්පීකරණය උත්තේජනය කිරීම	
4. බීජවල සුප්තතාව ඉවත් කිරීම	
5. බීජ රහිත ඵල ලබා ගැනීම	

C. පහත දැක්වෙන්නේ DNA ප්‍රතිසම්බන්ධීකරණයේ පියවර දැක්වෙන සටහනකි.

1.

2. ජානය කපා ඉවත් කිරීම

3. කපාගත් ජානය ගුණනය කිරීම

4.

5.ඉලක්ක ශාකයේ පටක වෙත ජාන ඇතුල් කිරීම

6.

7.

(i) ඉහත සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න

(ii) ඉහත 2 පියවර සඳහා යොදා ගන්නා එන්සයිමයක් සඳහන් කරන්න

....

(iii)ඉහත ක්‍රමය මගින් නිපදවනු ලබන ආහාර කුමන නමකින් හඳුන්වයි ද?

....

D. රූප සටහනේ දැක්වෙන්නේ ජල රෝපිත වගා ක්‍රමය භාවිතයෙන් බීට් රූට් වගා කර ඇති අයුරු ය.



ALapiedu.com

(i) මෙහි දැක්වෙන ජලරෝපිත වගා ක්‍රමය කුමක් ද?

....

(ii) මෙහි සිදුරු සහිත A නලය තුළ ඝන මාධ්‍ය පුරවා ඇත.මෙහි ප්‍රයෝජනය කුමක් ද?

....

(iii) C ලෙස බහුලව යොදා ගන්නා ද්‍රාවණයක් සඳහන් කරන්න

....

(iv) මෙවැනි නිර්පාංශු වගා ක්‍රම යොදා ගැනීමේ වාසි තුනක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....

3. A. පහත රූප සටහනේ දක්වා ඇත්තේ අතු බැදීමේ ආකාර කිහිපයකි.



A B C D

(i) A, B,C සහ D නම් කරන්න

A.. B..
C .... D...

(ii) ඉහත A සහ C ආකාරයට අතු බැදීම සිදුකළ හැකි ශාක වර්ගයක් බැගින් සඳහන් කරන්න

A ....
C ....

(iii) අතු බැදීමේ මූලධර්මය කෙටියෙන් සඳහන් කරන්න.

....
....
....

B. නිරෝගී ජීව්‍ය බීජ යොදා ගැනීම මගින් ඉහළ ගුණාත්මක අස්වැන්නක් ලබා ගත හැක

(i) බීජ ජීව්‍යතාව මැනිය හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

(ii) ගබඩා කිරීමේ ගැටලු හේතුවෙන් බීජ ජීව්‍යතාවට හානි පැමිණේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගබඩා පරිසරය තුළ අනුගමනය කළ හැකි ක්‍රියා තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

ALapiedu.com

C. පළිබෝධකයන් හේතුවෙන් අස්වැන්නේ ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක හානි සිදුවේ.

(i) පහත හානිවලට හේතුවන පළිබෝධකයා නම් කරන්න

හානිය	පළිබෝධකයා
ගොයම් ශාකයේ මළ හදවත තත්ත්වය සහ සුදු කරල් පීදීම	
කුකර්බිටේසියේ කුලයේ බෝගයේ පත්‍ර දැලක් ආකාරයට කා දැමීම	
කුඹුරේ තැනින් තැන වෘත්තාකාර පිළිස්සුම් දක්නට ලැබීම	
පොල් ගසේ විවෘත වන පත්‍ර කතුරකින් කැපුවා මෙන් දක්නට ලැබීම	

(ii) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනය යනු කුමක් ද?

....

....

(iii) ජෛව පාලනයේ වාසි හතරක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....
4. ....

D. බිලාන්වීකරණය හෙවත් සුබ්‍රිකරණය ආහාර පරිරක්ෂණයේ දී බහුලව යොදා ගනී.

(i) සුබ්‍රිකරණයේ මූලධර්ම තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

(ii) බිලාන්වීකරණය සිදු කරන ආකාර තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

E යකඩ ශරීර සෞඛ්‍යය සඳහා අත්‍යාවශ්‍ය වන පෝෂකයකි.

(i) යකඩවලින් සිරුරට ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

(ii) යකඩ බහුල ආහාර තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

(iii) යකඩ අනවශ්‍ය ලෙස වැඩිපුර ශරීරයට ලබා ගැනීමෙන් ඇතිවිය හැකි රෝගී තත්ත්වයක් සඳහන් කරන්න

....

ALapiedu.com

4. A. (i) වර්ණ වෙනස්වීම හැරුණුකොට පහත බෝග පරිණත වී ඇති බවට දෘෂ්ටි පරීක්ෂාව මගින් හඳුනාගත හැකි ලක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

a) අඹ - ....

b) කෙසෙල් - ....

(ii) රූපයේ දැක්වෙනුයේ පලතුරු ආකාර දෙවර්ගයක ඉදීමේ ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රස්තාර දෙකකි.



a) **A, B** පලතුරු කාණ්ඩ දෙක නම් කරන්න.උදාහරණයක් බැගින් දක්වන්න.

	කාණ්ඩය	උදාහරණ
A -	....	....
B -	....	....

B. පහත එක් එක් අවස්ථාවලදී පසු අස්වනු හානි අවම කර ගැනිමට ගත හැකි ක්‍රියාමාර්ගයක් බැගින් සඳහන් කරන්න

(i) අස්වනු නෙළීමේ දී

....

(ii) අස්වනු ප්‍රවාහනයේ දී

....

(iii) අස්වනු අලෙවියේ දී

....

C. ගොවිපොළ සතුන් ඇති කිරීම සැලකූ විට ගව දෙනුන් පාලනයට විශේෂ ස්ථානයක් හිමි වේ.

(i) ගවයාගේ ආහාර ජීර්ණ පද්ධතියේ පහත එක් එක් කොටස මගින් සිදු කරන කාර්යය බැගින් සඳහන් කරන්න

1. රූමනය - ....
2. බහුනැමිය - ....
3. ජඨරාශය - ....
4. කුඩා අන්ත්‍රය - ....

(ii) ප්‍රසූතිය සමඟ පැටවුන්ට සිදු කරනු ලබන පාලන ක්‍රියා දෙකක් සඳහන් කරන්න.

1. ....
2. ....

ALapiedu.com

(iii) දෙනකගේ මද ලක්ෂණ තුනක් සඳහන් කරන්න

1. ....
2. ....
3. ....

(iv) ගව පාලනයේ දී බහුලව භාවිතා කරනු ලබන සතුන් හඳුනා ගැනීමේ ක්‍රම දෙකක් සඳහන් කරන්න

1. ....
2. ....

(v) ගව දෙනුන්ට වැළදෙන පහත රෝගවලට හේතුවන රෝග කාරකය සඳහන් කරන්න

a) කුර හා මුඛ රෝගය - ....
b) කිරි උණ - ....
c) මැස්ටයිටිස් - ....

D. සහල් සඳහා සැපයුම් ශ්‍රිතය $Q_S = 4P - 50$ ලෙස දී ඇත.

(i) එය ඇසුරින් පහත සැපයුම් ලේඛනය සම්පූර්ණ කරන්න

සහල් කි.ග්‍රෑ.1 ක මිල (රු.)	සැපයුම් ප්‍රමාණය කි.ග්‍රෑ.
15	
25	
35	
45	

(ii) මෙම සැපයුම් ලේඛනයට අදාළ සැපයුම් වක්‍රය ප්‍රස්තාරයක් ලෙස ඉදිරිපත් කරන්න

(iii) රජය විසින් වී වගාව සඳහා පොහොර සහනාධාරය ලබා දුන්නේ නම් මෙම සැපයුම් වක්‍රයට වන බලපෑම ඉහත ප්‍රස්තාරයේ ම දක්වන්න.

E. පහත දැක්වෙන භෞතික ආපදාවන් නිසා ඇති විය හැකි සෞඛ්‍ය ගැටලුවක් බැගින් සඳහන් කරන්න

1.අධික ශබ්ද හා කම්පන - ....
2.විජලනය - ....
3.දූවිලි - ....

ALapiedu.com

සියළු හිමිකම් ඇවිරිණි/All Rights reserved

රචනා ප්‍රශ්න

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

(05) 1.ශ්‍රී ලංකාවේ ජාන සම්පත් ආරක්ෂා කර ගැනමේ වැදගත්කම පැහැදිලි කරන්න.

11.භූගත ජලය පුනරාරෝපනය කිරීම සදහා යොදා ගන්නා උපක්‍රම කෙටියෙන් විස්තර කරන්න.

111.රසායනික පොහොර යෙදීමේ වාසි සහ අවාසි විස්තර කරන්න.

(06) 1.කාබනික කෘෂිකර්මාන්තයේ දැකිය හැකි ලක්ෂණ විස්තර කරන්න.

11.බෝගවල අස්වනු හානි කෙරෙහි පෙර අස්වනු සාධකවල බලපෑම විස්තර කරන්න.

111.ආහාර ඇසුරුම්කරණයේ වැදගත්කම විස්තර කරන්න.

(07) 1.වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අභියෝග විස්තර කරන්න.

11.තිරසාර කෘෂිකර්මාන්තයක අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

111.ගුණාත්මයෙන් යුත් වැඩි කිරි නිෂ්පාදනයක් ලබා ගැනීමේ අරමුණින් ගව දෙනක කිරි දෙවීම සදහා සූදානම් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාකාරකම් විස්තර කරන්න.

(08) 1.ප්‍රභාසංස්ලේෂණයට බලපාන සාධක විස්තර කරන්න.

11.පැහැදිලිව නම් කළ රූපසටහන් ආධාරයෙන් ඒක බීජ පත්‍රී හා ද්විබීජ පත්‍රී බීජ වල ප්‍රධාන වෙනස්කම් විස්තර කරන්න.

111.පසක් පුනරුත්තාපනය කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

ALapiedu.com

(09) 1.පළිබෝධ පාලනයේදී ආර්ථික හානිදායි මට්ටම (**EIL)** හා ආර්ථික දේහලිය මට්ටම(**ETL)**අතර වෙනස සහ එම අගයන් දෙකෙහි වැදගත්කම් පැහැදිලි කරන්න.

11. ශ්‍රී ලංකාවේ වෙළඳ පොළෙහි එළවළු සැපයුමට බලපාන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

111.බිම් සැකසීමේ අරමුණු පැහැදිලි කරන්න.

(10) 1.නිර්පාංශු වගාවක් සඳහා වගා මාධ්‍යක් තේරීමේදී සැළකිය යුතු කරුණු විස්තර කරන්න.

11.ආලෝකය බෝග නිෂ්පාදන කටයුතු වලට බලපාන ආකාරය විස්තර කරන්න.

111.රෝගී ගොවිපළක සතුන්ගේ පොදු රෝග ලක්ෂණ සඳහන් කරන්න.සත්ව ගොවිපළක රෝග පාලනය සඳහා ගතහැකි පූර්වෝපායන් කවරේද?

ALapiedu.com